# තහංචි මැද්දෙන්

සුනන්ද දේශප්‍රිය

2007 07 01

# මංගල පක්ෂය සහ පුරවැසි සිහිනය

මගේ ඡන්දය මංගලට යැයි  මංගලගේ සිහිනයේ අභියෝගය කිය වූ එජාප හිතවාදී තරුණ බුද්ධිමතකු ලියා එවූයේ එංගලන්තයේ සිට ය. ඔහු මෙසේද කීය: *මංගල බර එජාපයට බව පැහැදිලි යි.*

සුවය ලබමින්  සිටි තවත් ශ්‍රීලනිපවාදී දේශපාලන මිතුරකු කීයේ කතාව හොඳයි ගන්න දේවල් තියෙනවා කියා ය. *ශ්‍රීලනිපය තුළ මංගලගේ බෙදීම විසින් යම් දෙරීමක් ඇති කර ඇතැයි* ඇමැතිවරයකුට සමීප ජනමාධ්‍යවේදියකු කීයේ ය.

ශ්‍රීලනිපයේ සිට එජාපයට ගිය තරුණ බුද්ධිමතකු කීයේ *මට එජාපයට යන්න වුනේ මංගල නිසා, ඒ නිසා මට නම් අප්පිරියයි කියා ය. ඔහු මෙසේ ද කීය. දේශපාලනඥයින්ට වෙනස් වෙන්න අවස්ථාවක් තියෙන්න ඕන. නමුත් ඒ වෙනස අවංක ද කියා මැනෙන්නේ කොහොම ද?*

මිතුරු ගුරුවරියක ගේ අදහස වූයේ මෙය යි: *ආණ්ඩුව මංගලට ගහපු හැටි දරුණු වැඩියි. ඒ ගැන හුග දෙනෙක් කැමැති නැහැ. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කළ ගුණ සළකන්න දන්නේ නැතැයි හුගක් අය කියනවා.*

මංගලගේ ඉවත්විමත් වෙනම දේශපාලන ප්‍රවණතාවයක් ලෙස සංවිධානය විමට දරණ උත්සාහයත් විසින් දේශපාලන සමාජය තුළ සංවාදයක් සාකච්ඡාවක් ඇති වෙමින් තිබේ. ලලිත් ගාමිණී දෝශාභියෝගය විසින් ඇති කළ දේශපාලන සංවාදය යොමු වූයේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ ජනවාර්ගික ගැටළුවට සාමකාමී විසඳුමක් සෙවීම යන දිශානතිය කරා ය. එසේ නම් මංගල - ශ්‍රීපති දේශපාලනය විසින් ඇති කරන සංවාදය දිශාගත වනු ඇත්තේ සහ විය යුත්තේ කුමන ඉලක්කයක් වටා ද?

මංගල දේශපාලන දිය සුළියක් ඇරඹීමට සමත්වනු ඇත්ද? ශ්‍රීලනිප තුළ ඔහු විසින් ඇති කරනු ඇත්තේ කෙබඳු බලපෑමක් ද? මංගල - රනිල් නායකත්වයෙන් නව දේශපාලන බල කේන්ද්‍රයක් නිර්මානය වීමට ඉඩක් ඇත් ද?

ප්‍රථමයෙන්ම මංගල සහ ශ්‍රීපති තමන්ගේ මෑත කාලීන දේශපාලනය දෙස හැරී බැලීම වැදගත් ය. අලි - කොටි ගිවිසුම ගැන අලංකාර කතා නිර්මාණය කරන අතරම මහින්ද රාජපක්ෂ බලයට ගෙන ඒම වෙනුවෙන් ශ්‍රීලනිප- කොටි එකඟතාවයක් හදා ගැනීමට කටයුතු කලේ මෙම පිරිස ය. දැන් ඔවුන්ම පිලි ගන්නා පරිදි මහින්ද රාජපක්ෂ වෙනුවෙන් එල්ටීටීඊ යට මුදල් ලබා දීමට ද මැදිහත් වූයේ ඔවින් ය.

ද්‍රෝහී අලි - කොටි ගිවිසුම යනුවෙන් ඔවුන් විසින් ම රනිල්ට එරෙහිව ගොඩ නැගූ මතවාදය ලෙහෙසියෙන් ම මංගල පාර්ශවය වෙත හැරවූ  මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ශ්‍රීපතිගේ සිට ටිරන් අලස් දක්වා අත් අඩංගුවට ගැනීමට එම දේශපාලනය ම යොදා ගත්තේ ය. එලෙස අභූත චෝදනා මත අත් අඩංගුවට ගත් ශ්‍රීපති මිතුරු නාවික නිලධාරී දැන් ජීවත් වන්නේ අර්ධ රහසිගතව සිය ගමෙන් බැහැරව ය.

ත්‍රස්තවාදය සමඟ සටන් කිරීමේ දී ඕනෑම උපායක් සාධාරණ යැයි ගෝඨාභය රාජපක්ෂ කී පරිදි ම දේශපාලනයේ දී බලය ගැනීම පිණිස ඕනෑම බොරුවක් සහ වසන් කිරීමක් සාධාරණය යන තර්කය අලි - කොටි කතාවේ ක්‍රියාවෙහි පසුබිම විය. තව දුරටත් එම තර්කය මංගල ශ්‍රීපති කණ්ඩායම අනුගමනය කරන්නේ ද? යන්න ඇසීම ජනමාධ්‍යවේදීන් වශයෙන් අපේ යුතුකමකි.

මංගල චන්ද්‍රිකා ආණ්ඩුවේ ජන මාධ්‍ය ඇමැති විය. 1995 ජනමාධ්‍ය නීති ප්‍රතිසංස්කරණ පිලිබඳ ආර් කේ ඩබ් ගුනසේකර වාර්තාව මෙන්ම ලේක්හවුසියේ අයිතිය පුලුල් කිරීම පිලිබඳ සිදත් ශ්‍රී නන්දලෝචන වාර්තාව ද ක්‍රියාවට නැංවීම මගින් ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය නිදහස තහවුරු කිරීමේ මහගු අවස්තාවක් ඔහු සතු විය. නමුත් ඒ සියළු වාර්තා හමස් පෙට්ටටියට දැමුනි. රාජ්‍ය මාධ්‍ය දේශපාලනීය කිරීමේ සාපය දැන් මංගල සමරවීර මහතා පසු පසු ද එලවයි.

ඔහු විසින්ම ඉහලට ඔසවා තැබූ වත්මන් දිනමිණ කර්තෘ පසුදාක ලියා තිබුනේ මංගල යන නමෙහි **ම** යන්නද **බින්දුවද** නරක බැවින් ඒවා ඉවත්කළ විට නියම නම ලැබෙන බව යි. විට ඉතිරි වන්නේ **ගල** යන අකුරු දෙක ය. මෙම කර්තෘවරයා ලවා විරුද්ධවාදීන්ට මෙලෙස අසික්කිත ප්‍රහාරයන් දීම මංගල ද අනුමත කළ කාලයක් තිබුණි. එකල කතුවැකියක් ලියමින් මෙම කතුවරයා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඌරන් රංචුවක් ලෙස හැදින්වූවේ ජනමාධ්‍යට නොහිබිනා වචන පවා යොදා ගනිමිනි.

ඕංගල දේශපාලනය ප්‍රශ්න කිරීම මගින් මංගල සමරවීර මහතා මෙම දේශපාලන මොහොත තුළ ඉටු කරන ප්‍රජාතන්ත්‍රවාදී භූමිකාව යටපත් වන්නේ නැත. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව එන්න එන්නම අධිකාරීවාදී ප්‍රවණතාවයක් කරා ඇදී යමින් තිබෙන අතර ඊට සාපේක්ෂව මංගල සමරවීර ඉටු කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදී භූමිකාවකි. එය සාධනීය වර්ධනයකි.

අනෙත් අතට මංගල සමරවිර දේශපාලනය චන්ද්‍රිකා කුමාරතුංග සමඟ බැදී යන එකක් වන්නේ නම් ද එය විසින් ද ඇති කරන ප්‍රශ්න බරපතල වනවා ඇත. වසර 10ක ඉක්ම වු ඇයගේ පාලන කාලය පිරී තිබුණෝ බලය අනිස ලෙස පාවිච්චි කිරීමෙන්, දූෂනයෙන්, භීෂනයෙන් සහ රුවටීමෙනි. ඇය තබා ගිය සාධනීය ලකුණක් නැත. ශ්‍රී ලංකාව සඳහා ප්‍රජාතන්ත්‍රීය දැක්මක් චන්ද්‍රිකා විසින් සපයනු ඇතැයි විශ්වාස කරන දැනුවත් පුරවැසියෙක් සිටිනු නොහැකි ය.

සමරවීර මහතා ජවිපෙ සමඟ ද එජාපය සමඟ ද දෙමළ සන්ධානය සමඟ ද සාකච්ජා කිරීම හොද ය. නමුත් කුමක් සදහා ද යන්න මිට වඩා පැහැදිළි විය යුතු ය. ඔහුගේ ප්‍රකාශිත අරමුණ ශ්‍රීලනිපය යළි සාමයේ සහ යහ පාලනයේ මාවතට ගැනිම නම් සෙවිය යුත්තේ වැරදුනේ කොතැන ද කියා ය. එය අපූරු ප්‍රජාතන්ත්‍රවාදී සංවාදයක් විය හැකි ය.

එජාපය කිසි දිනෙක එවැනි සංවාදයකට සූදානමක් පෙන්වා නැත. ජවිපෙ පෙන්වා ද නැත. එජාප ය ජේ ආර් සහ ප්‍රේමදාස යුගය වීරත්වයට වංචන අතර ජවිපෙ භීසනයෙන් පිරී ගිය 1988-1990 යුගය සමරන්නේ විජේවීරගේ ස්වර්ණමය යුගය ලෙස ය.

යම් මට්ටමක හෝ එවැනි ආපසු හැරි බැලීමක් දක්නට තිබුනේ 1992 -1994 යුගයේ ශ්‍රීලනිපය තුළ පමණ ය. එකළ එස්බී ලා සහ මංගලා ඉදිරියෙන් ඇතිව එය ප්‍රජාතන්ත්‍රවාදි සිවිල් සමාජය සමඟ එක්ව ගමන් කරමින් අලුත් දැක්මක් සොයමින් සිටියේ ය. අන්තිමේ දී 94 ජයග්‍රහණය ආපසු හැරවීමට චන්ද්‍රිකාට එස්බී ලා ද මංගලාද එකසේ දායක වූහ.

දැන් මංගල පමණක් නොව එස් බී වුව අලුත් යැයි අපට නිකමට හෝ සිතා ගත හැකි ද? මහත්වරුනි ඒ සඳහා ඔබ තව කළ යුතු දේ බොහෝ ය. නව බල කේන්ද්‍රයක් ගොඩ නැගෙනු ඇත්තේ සැබෑ වෙනසක් මත පමණි.

සමහර විට පුරවැසි සිහිනයේ අභියෝගය එවැනි වෙනසක් විය හැකි ය.